දුරකථන/தொலைபேசி இல/Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No.: ED/3/37/6/147

දිනය / திகதி / Date: 2011.11 24

**චක්‍රලේඛ අංකඃ 2011/32**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

අධ්‍යාපන අධ්‍යක්ෂ/ජාතික පාසල් සම්බන්ධීකරණ

සියලු ම කොට්ඨාසභාර නි.අ.අ./ස.අ.අ.වරුන්

"ප්‍රාථමික පාසල් ජාල සඳහා ද්විතියික පාසල් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන" සඳහා තෝරාගත් ජාතික හා පළාත් ද්විතියික පාසල් විදුහල්පතිවරුන්

## "ප්‍රාථමික පාසල් ජාල සඳහා ද්විතියික පාසල් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන (2012-2016)"

ශ්‍රී ලංකාවේ අනාගත දැනුම් කේන්ද්‍රයට අවශ්‍ය මානව ප්‍රාග්ධන පදනම බිහිකිරීම සඳහා, මහින්ද චින්තන ඉදිරි දැක්ම (2010) මගින් නිර්දේශිත පරිදි අවශ්‍ය ගුණාත්මක බවින් පිරිපුන් ද්විතියික පාසල් හා ඊට සමගාමී වූ පෝෂිත ප්‍රාථමික පාසල් සමූහයක් වැඩිදියුණු කිරීම, අධ්‍යාපන ජාතික හා පළාත් මට්ටමේ ප්‍රධාන ඒකාබද්ධ මධ්‍යකාලීන (2012-2016) ජාතික වැඩසටහන ලෙස හඳුනා ගනු ලැබ ඇත.

2.0 අතිගරු ජනාධිපතිතුමා විසින් 2011.11.21 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2012 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාවන් හි මෙම ජාතික වැඩපිළිවෙල සඳහා අතිරේක ප්‍රතිපාදන ඇතුළත් කර ඇති අතර එමගින් ඊට දැක්වෙන රාජ්‍ය දායකත්වය ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව මෙම ජාතික වැඩසටහන 2012 වසරේ දී ඇරඹේ.

3.0 මෙම වැඩසටහනේ පාසල් තෝරාගත් පදනම, අභිමතාර්ථ හා අරමුණු, පහත දැක්වේ.

### 3.1 පාසල් තෝරාගත් පදනම

මෙම වැඩසටහනට පාසල් තෝරාගන්නා ලද්දේ භූගෝලීය පිහිටීම, ප්‍රවේශ මාර්ග හා පොදු පහසුකම්, ප්‍රදේශයේ ද්විතීයික හා ප්‍රාථමික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව සහ දැනට තිබෙන සම්පත්, ශිෂ්‍ය ගලනයේ ස්වභාවය, පාසල් අතර දුර, සංස්කෘතිකමය සහ පාරිසාරික සාධක ඇතුළු නිර්ණායක පදනම් කරගත් ක්‍රමවේදයක් ඇසුරිනි. ඒ අනුව සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම අවම වශයෙන් ද්විතියික පාසල් 2-3ක්

වැඩිදියුණු වන පරිදි සහ එම සෑම ද්විතියික පාසලකටම ආසන්නතාව මත පෝෂිත ප්‍රාථමික පාසල් 3-5 අතර සංඛ්‍යාවක් සම්බන්ධ වන පරිදි මෙම පාසල් ජාලය හඳුනාගනු ලැබ ඇත.

වැඩසටහනේ අභිමතාර්ථ සහ අරමුණු පහත දැක්වේ.

**3.2 අභිමතාර්ථ**

ශ්‍රී ලංකාවේ අනාගත දැනුම් කේන්ද්‍රයට, ජාතික හා ජාත්‍යන්තර දැනුම් ආර්ථිකයට සරිලන දැනුම, කුසලතා, ආකල්ප හා අගයන්ගෙන් පරිපූර්ණ වූ ශ්‍රී ලාංකික පුරවැසියන් බිහි කිරීමේ පදනම ලෙස උසස් මට්ටමේ අධ්‍යාපන අවස්ථා සහතික කෙරෙන ගුණාත්මක බවින් යුත් ද්විතියික පාසල් පද්ධතියක් නිර්මාණය කිරීම සහ ඒවා පෝෂණය කෙරෙන ප්‍රාථමික පාසල් ජාල නිර්මාණය කිරීම.

**3.3 අරමුණු**

- නිදහස් අධ්‍යාපනය හා අනිවාර්ය අධ්‍යාපනය තහවුරු වන පරිදි සියලු දරුවන්ට සම හා උසස් මට්ටමේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවස්ථා සැපයීම හා ප්‍රශස්ථ මට්ටමේ සම්පත් උපයෝජනය.
- ද්විතියික අධ්‍යාපන අවස්ථාවන්ට අදාල සියලු ම විෂය ධාරාවන් ඉගෙනීම සඳහා අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.
- ජානන කුසලතා හා ප්‍රායෝගික ඉගෙනුම් කුසලතා ප්‍රවර්ධනය හරහා සිසුන්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් ඉහළ නැංවීම.
- මධ්‍යකාලීන වැඩසටහනක් ලෙස පෝෂිත ප්‍රාථමික පාසල් ජාලය වැඩිදියුණු කිරීම.
- නාගරික පාසල්වලට ඇති අනවශ්‍ය හා කෘත්‍රිම තරඟකාරීත්වය අවම කිරීම.

4.0 මෙම ජාතික වැඩපිළිවෙල 2012 ජනවාරි මස ආරම්භ කර මධ්‍යකාලීන සංවර්ධන වැඩසටහනක් ලෙස 2016 වර්ෂය තෙක් දියත් කෙරෙන අතර ඒ හරහා ද්විතියික පාසල් දහසක් හා ප්‍රාථමික පාසල් පන්දහසක් පමණ සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

5.0 මෙම වැඩසටහනට තෝරාගෙන ඇති ද්විතියික පාසල් පහත සඳහන් කාණ්ඩ තුන යටතේ හඳුනා ගනු ලැබ ඇත.

**(අ). පළමු කාණ්ඩයේ පාසල්**

2011 වර්ෂය දක්වා 1-13 හෝ 1-11 ශ්‍රේණි සහිත පාසල් වශයෙන් පැවතුණු (1AB/1C/ 2 වර්ග) එහෙත් 2012 වර්ෂයේ සිට වසරින් වසර 1 ශ්‍රේණියට සිසුන් බඳවා නොගැනීම මගින්, ක්‍රමිකව ප්‍රාථමික අංශය ඉවත් වීම හේතුවෙන් ද්විතියික පාසල් බවට පත්වීමට සැලසුම් කර ඇති පාසල්.

**(ආ). දෙවන කාණ්ඩයේ පාසල්**

දැනට ද ප්‍රාථමික පංති නොපැවැත්වෙන 6-13 ශ්‍රේණි සහිත (1AB/1C) පාසල්.

**(ඇ). තෙවන කාණ්ඩයේ පාසල්**

2011 වර්ෂය දක්වා 1-11 හෝ 1-13 ශ්‍රේණි සහිත පාසල් වශයෙන් පැවතුණු (1AB/1C/2 වර්ග) එහෙත් 2012 වර්ෂයේ දී ම 1-5 ප්‍රාථමික ශ්‍රේණි සියල්ල එකවර ඉවත්කර වෙනම ප්‍රාථමික පාසලක් ලෙස පළාත් සභා යටතේ ලියාපදිංචි කිරීම මගින් ද්විතියික පාසලක් බවට පත් වීමට සැලසුම්කර ඇති පාසල්.

6.0 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී අදාල පාසල්වල විදුහල්පතිවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යාපන ලේකම්වරුන් හා අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල් සම්බන්ධීකරණ) විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට අවධාරණය කරමි.

**(අ). පළමු කාණ්ඩයේ පාසල්**

1. 2012 සිට 2016 දක්වා වසරින් වසර 1 ශ්‍රේණි ඉවත් කිරීම මගින්, ප්‍රාථමික ශ්‍රේණි ක්‍රමානුකූලව ඉවත් කොට 6-13 ශ්‍රේණි සහිත ද්විතියික පාසලක් ලෙස සංවර්ධනය කළ යුතුය.

2. ඒ අනුව 1 ශ්‍රේණියට සිසුන් බඳවා නොගැනීම මගින් ක්‍රමිකව ප්‍රාථමික අංශ අහෝසි කර 6-13 පාසලක් බවට පත් කර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහ කමිටු අනුමැතිය, ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ද ලබාගත යුතුය.

3. 2012 වර්ෂය සඳහා පාසලේ 1 ශ්‍රේණියට මේ වන විට අයදුම්පත් කැඳවා ඇත්නම්, විදුහල්පති විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ උපදෙස් මත එම අයදුම්පත් ප්‍රදේශයේ තෝරා ගත් ප්‍රාථමික පාසල් වෙත යොමු කළ යුතුය.

4. මෙම කාණ්ඩයේ පාසල්වල ප්‍රාථමික අංශ ක්‍රමිකව ඉවත්ව 6-13 පාසලක් බවට පත් වන තුරු එම පාසලේම ප්‍රාථමික අංශය 5 ශ්‍රේණිය සමත් වන සිසුන් 6 ශ්‍රේණියට ඇතුළත් කළයුතු බැවින් අවට පෝෂිත පාසල්වලින් 6 ශ්‍රේණියට අයදුම් කරන සිසුන් ඇතුළත් කිරීමට පියවර ගැනීමේ දී ඉඩකඩ පිළිබඳ ගැටළුවක් මතුවේ නම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් මෙම පාසල පූර්ණ ද්විතියික පාසලක් බවට පත්වී පෝෂිත පාසල්වල සියලු ම අයදුම්කරුවන් ඇතුළත් කිරීමට ඉඩකඩ සම්පාදනය වන තුරු අවශ්‍ය ඉඩකඩ පුළුල් කර අවස්ථා සලසා දීමට කටයුතු කළ යුතුය.

5. තෝරාගත් කිසියම් ද්විතියික පාසලක්, මේ වන විටත් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය මත කඩඉම් ලකුණක් තීරණය වන පාසලක් නම්, එකී පාසල ශිෂ්‍යත්වධාරීන්ගේ පංති සංඛ්‍යාව නොවෙනස්ව පවත්වා ගත යුතු අතර එම පංති, ලකුණු අනුපිළිවෙල අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යොමු කරනු ලබන ශිෂ්‍යත්වධාරීන්ගෙන් පිරවිය යුතුය.

6. පාසලේ ප්‍රාථමික අංශය ඉවත් කිරීමෙන් හිස්වන ඉඩකඩ 6 ශ්‍රේණියට වැඩිපුර එක්වන පංති සඳහා භාවිතා කළ යුතුය. මේ සඳහා අවශ්‍ය වන ලී බඩු උපකරණ පාසල තුලින් ම සපයාගත නොහැකි අවස්ථාවල දී, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මත, වෙනත් පාසල්වල අතිරික්ත වන ලීබඩු උපකරණවලින් සපුරාගැනීමට කටයුතු කළ යුතුය.

7. ප්‍රාථමික ශ්‍රේණි ඉවත්වීම නිසා අතිරික්ත වන ලිබඩු හා උපකරණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ උපදෙස් මත සාධාරණ බෙදා හැරීමේ ක්‍රමවේදයක් තුළින් හඳුනා ගත් ප්‍රාථමික පාසල්වලට බෙදා හැරිය යුතුය.

8. 2012 වසරේ සිට ප්‍රාථමික අංශයේ අතිරික්ත වන ගුරුවරු වෙත්නම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අවශ්‍යතා පදනමින් හඳුනාගත් ප්‍රාථමික පාසල්වලට ස්ථානමාරු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුය.

(ආ). දෙවන කාණ්ඩයේ පාසල්

1. 6 ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමේ දී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වයෙන් සුදුසුකම් ලබන දරුවන් සඳහා ප්‍රමුඛතාව ලබාදී කටයුතු කිරීම සඳහා ශිෂ්‍යත්වධාරීන්ගේ පංති සංඛ්‍යාව නොවෙනස් ව පවත්වා ගත යුතුය. මෙහිදී 6 ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ දී:

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වයෙන් සුදුසුකම් ලබන වන සිසුන් සඳහාත්,

(ii) පෝෂිත ප්‍රාථමික පාසල්වලින් පැමිණෙන සිසුන් සඳහාත්,

අවස්ථාව ලබා දී, තවදුරටත් 6 ශ්‍රේණියේ පුරප්පාඩු පවතින්නේ නම් අනෙකුත් පාසල්වලින් අයදුම් කරන සිසුන් සඳහාත් අවස්ථාව ලබාදිය යුතුය.

2. උක්ත පදනම මත සිසුන් ඇතුළත් කිරීමේ දී අයදුම්කරන පෝෂිත පාසල්වල අයදුම්කරුවන් එම පාසලට ඇතුළත් කරගැනීමට වගබලා ගත යුතුය.

3. ද්විතියික පාසල් ලෙස සංවර්ධනය වන පාසල්වලට පෝෂිත පාසල්වලින් 6 ශ්‍රේණියට දරුවන් වැඩිපුර ඇතුළත් වීම සමඟ පැන නඟින නව ගුරු අවශ්‍යතා, අදාල කොට්ඨාශය/කලාපය තුළ තුලනය කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කර තිබිය යුතුය. එසේ නොහැකි අවස්ථාවන්හි දී, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඒ බැව් වාර්තා කළ යුතුය.

(ඇ). තෙවන කාණ්ඩයේ පාසල්

1. 6 ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීමේ දී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වයෙන් සුදුසුකම් ලබන දරුවන් සඳහා ප්‍රමුඛතාව ලබාදී කටයුතු කිරීම සඳහා ශිෂ්‍යත්වධාරීන්ගේ පංති සංඛ්‍යාව නොවෙනස් ව පවත්වා ගත යුතුය. මෙහිදී 6 ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ දී:

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වයෙන් සුදුසුකම් ලබන සිසුන් සඳහාත්,

(ii) පෝෂිත ප්‍රාථමික පාසල්වලින් පැමිණෙන සිසුන් සඳහාත්, (මෙම අදාල ද්විතියික පාසලෙන් ඉවත්ව ප්‍රාථමික පාසලක් බවට පත් වූ පාසල ද ඇතුලුව) අවස්ථාව ලබා දී තවදුරටත් 6 ශ්‍රේණියේ පුරප්පාඩු පවතින්නේ නම්, අනෙකුත් පාසල්වලින් අයදුම්කරන සිසුන් සඳහාත් අවස්ථාව ලබාදිය යුතුය.

2. උක්ත පදනම මත සිසුන් ඇතුළත් කිරීමේ දී අයදුම්කරන පෝෂිත පාසල්වල අයදුම්කරුවන් එම පාසලට ඇතුළත් කරගැනීමට ද වගබලා ගත යුතුය.

3. 2011.12.31 දිනට පෙර යෝජිත ප්‍රාථමික පාසල් පළාත් ප්‍රාථමික පාසලක් ලෙස ලියාපදිංචි කළ යුතුය.

4. ද්විතියික පාසලේ ප්‍රාථමික අංශයේ සේවය කරන ගුරුවරුන් සුදුසු පරිදි නව ප්‍රාථමික පාසලට ස්ථානමාරු කිරීමට අවශ්‍ය කටයුතු යෙදිය යුතුය. ජාතික පාසලක ප්‍රාථමික අංශය ඉවත් වීමේ දී ගුරුවරුන් ස්ථාන මාරු කෙරෙන විට අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ඊට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

5. ද්විතියික පාසලේ ප්‍රාථමික අංශය යටතේ ඇති සියලු ම ලී බඩු උපකරණ නියමිත පරිදි නීත්‍යානුකූලව නව ප්‍රාථමික පාසලට ලබාදිය යුතුය.

7.0 දැනටමත් "ඉසුරු පාසල් " වැඩසටහනට ඇතුළත් කර ඇති පාසල් සියල්ල ද ද්විතියික පාසල් සංවර්ධනය කිරීමේ වැඩසටහනට ඇතුළත් කෙරෙන බැවින් එම පාසල් සම්බන්ධයෙන් ද අදාළ පරිදි ඉහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළයුතු බව අවධාරණය කරමි.

8.0 ප්‍රාථමික අධ්‍යාපනය අවසන් කරන යම් සිසුවෙකුට ද්විතියික පාසලක් ලබාගැනීමේ දී යම් ගැටළුවක් මතු වන්නේ නම් කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එම ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

9.0 ද්විතියික පාසල්වල 6 ශ්‍රේණියට ඇති විය හැකි ඉල්ලුම සලකා බැලීමෙන් පසුව උපරිම සමාන්තර පන්ති සංඛ්‍යාවක් තීරණය කිරීම වඩාත් යෝග්‍ය බව හැඟී ගියහොත්, අදාල ව්‍යුහ කටයුතු පිළිබඳ තීරණ රේඛීය අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන බලධාරීන් ඒකාබද්ධව නිකුත් කිරීමට පියවර ගැනේ.

10.0 මෙම ජාතික වැඩසටහනට ඇතුළත් වන සියලු ම ද්විතියික පාසල් වාර්ෂික සංවර්ධන සැලැස්මක් හා 2012-2016 (පස් අවුරුදු) මධ්‍යකාලීන සැලැස්මක් හරහා සංවර්ධනය කළ යුතුය.

11.0 මෙම වැඩසටහන යටතේ හඳුනා ගෙන ඇති පෝෂිත ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම සඳහා ද අධ්‍යාපන අමාත්‍යාංශය සහ සියලු ම පළාත් අධ්‍යාපන බලධාරීන් ඒකාබද්ධව මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මක් හරහා අදාළ පියවර ගත යුතු වේ.

12.0 මෙතෙක් කිසියම් පාසලක් ද්විතියික පාසලක් ලෙස හෝ මෙම වැඩසටහනට අදාල පෝෂිත ප්‍රාථමික පාසලක් ලෙස නම් කර නොමැති නම් එම පාසල්වලට ද රාජ්‍ය ආධාර මත, පාසල පදනම් කරගත් සැලැස්මක් සහිත සංවර්ධන ප්‍රවේශයක් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් හඳුන්වාදිය යුතුය. මෙහිදී හුදෙකලා ප්‍රදේශවල පවත්නා කුඩා පාසල් සඳහා විශේෂ අවධානයක් හා අනුග්‍රහයක් දැක්විය යුතුය.

13.0 මෙම වැඩසටහනට සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ හා මෙම චක්‍රලේඛයෙන් මතුවන යම් ගැටළු සහගත තත්ත්වයක් වෙතොත් ඒ සම්බන්ධ අවසාන තීරණ ගැනීමේ බලය අධ්‍යාපන ලේකම් සතුවේ.

එච්.එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්: 1. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
2. ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
3. ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය
4. සභාපති, මුදල් කොමිෂන් සභාව
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
6. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
7. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්